**09 ශ්‍රේණිය**

# පළමු වාර පරීක්ෂණය - 2018 මාර්තු

**ගණිතය** කාලය පැය 2යි.

නම/විභාග අංකය :


## A කොටස

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. එක් ප්‍රශ්නයකට ලකුණු 2 බැගින් හිමිවේ.**

(01) 35, 32, 29, ............... සංඛ්‍යා රටාවේ ඊළඟ පද දෙක ලියන්න.

(02) $2500l$ යන්න $m^3$ වලින් දක්වන්න.

(03) 11දෙක + 10දෙක සුළු කරන්න.

(04) 


මෙම වෘත්තයේ කේන්ද්‍රය O වේ.

i) AO යනු කුමක් ද?

ii) අඳුරු කළ ප්‍රදේශයට සුදුසු නම ලියන්න.

(05) 1 ත් 10 ත් අතර වර්ග සංඛ්‍යා කුලකය ලැයිස්තුගත කරන්න.

www.mathsland.org


(06) සාධක වෙන් කරන්න.

$2x+3ax+4y+6ay$

(07) සුළු කරන්න.


| | t | kg |
|---|---|---|
| | 2 | 375 |
| + | 4 | 875 |

(08) රුපියල් 4000 ක භාණ්ඩ අලෙවියක් සඳහා 5% ක කොමිස් මුදලක් ලැබේ නම් එම මුදල සොයන්න.

(09) 


මෙම ත්‍රිකෝණයේ වර්ගඵලය සොයන්න.


(10) $\frac{x^2 \times x^3}{x}$ සුළු කරන්න.

(11) 

මෙයින් නිරූපිත අසමානතාව ලියා දක්වන්න.

(12) අඹ තොගයකින් $\frac{1}{5}$ ක් නරක් වූයේ නම් නරක් වූ අඹ ප්‍රතිශතය කොපමණ ද?

(13) 7 : ............ = 21 : 12 වේ නම් හිස්තැනට සුදුසු අගය ලියන්න.


(14) 

$x$ හි අගය සොයන්න. (AB හා OC සරල රේඛා වේ.)

www.mathsland.org

(15) 3.75 × 0.1 අගය සොයන්න.

(16) චතුස්තලයක මුහුණතක හැඩය කුමනාකාර වේද? එහි දාර ගණන කොපමණ ද?

(17) 

මෙම රූපයේ පරිමිතිය සොයන්න.

(18) රතුපාට සීනිබෝල 4 ක් හා කහ පාට සීනිබෝල 3 ක් අතුරින් අහඹු ලෙස සීනිබෝලයක් ගැනීමේ දී එය රතුපාට එකක් වීමේ සම්භාවිතාව කොපමණ ද?

(19) 1 : 50 000 පරිමාණයට ඇඳින ලද සිතියමක 3cm කින් නිරූපිත සැබෑ දිග සොයන්න.

(20) AB = BC ද AB = AC ද යැයි දී ඇති විටක,

i) BC හා AC අතර සම්බන්ධය ලියන්න.

ii) AB, BC, AC යනු ත්‍රිකෝණයක පාද වේ නම් ABC යනු කවර ආකාරයේ ත්‍රිකෝණයක් ද?

## II කොටස

**පළමු ප්‍රශ්නයට සහ තවත් ප්‍රශ්න 04 කට පිළිතුරු සපයන්න.**

**(පළමුවන ප්‍රශ්නයට ලකුණු 16 ද අනෙක් එක් එක් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.)**

(01) ලාභ, අලාභ වට්ටම් හා කොමිස් පිළිබඳව ඔබ පන්ති කාමරයේ දී උගත් පාඩම සිහිපත් කර ගන්න.

a) ඉහත කරුණු පිළිබඳ තොරතුරු රැස් කළ ස්ථාන 3 ක් නම් කරන්න.

b) කඩ හිමියෙක් ඇඳුම් මසන්නියකගෙන් එකක් රු 200 බැගින් ළමා ඇඳුම් 20 ක් මිල දී ගනියි. ඉන්පසු එක් ඇඳුමකින් 2% ක ලාභයක් ලැබෙන සේ ඇඳුමක මිල ලකුණු කරයි.

i) කඩ හිමියා ඇඳුමක ලකුණු කළ මිල කොපමණ ද?

ii) ඇඳුම විකිණීමේ දී 8% ක වට්ටමක් පාරිභෝගිකයාට ලැබේ නම් වට්ටම හා ඇඳුම ලබාගත හැකි මිල සොයන්න.

iii) කඩ හිමියාට ඇඳුම් ගැනීමට වැය වූ මුදල සොයන්න.

iv) ඔහු ඇඳුම් සියල්ල විකුණුවේ නම් විකිණීමෙන් ලද ආදායම සොයන්න.

v) කඩ හිමියා ලැබූ ලාභ ප්‍රතිශතය ගණනය කරන්න.

(02) i) $x^2-16$ හි සාධක සොයන්න.

ii) $x=2$ හා $y=-1$ විට $2x+y$ හි අගය සොයන්න.

iii) $3(x+1)=9$ විසඳන්න.

iv) $m^2+10m+25$ හි සාධක සොයන්න.

v) $(x+2)(x+3)$ ප්‍රසාරණය කරන්න.

(03) ජංගම අලෙවිකරුවෙකු පළමු දිනයේ දී හඳුන්කූරු පෙට්ටි 3ක් ද දෙවන දිනයේ දී ඊට වඩා 2 ක් වැඩිපුර ද තුන්වන දිනයේ දී දෙවන දිනයට වඩා 2ක් වැඩියෙන් ද ආදී ලෙස වෙළඳාමේ යෙදෙයි.

i) පළමු දින 3 දී අලෙවිකරුවා විකුණන හඳුන්කූරු පෙට්ටි ගණන සංඛ්‍යා අනුක්‍රමයක් ලෙස ලියන්න.

ii) 5 වන දිනයේ දී අලෙවිකරන හඳුන්කූරු පෙට්ටි ගණන කීයද?

iii) හඳුන්කූරු පෙට්ටි 21 ක් අලෙවිකරනුයේ ආරම්භයේ සිට කීවෙනි දිනයේ දී ද?

iv) ඔහු සති 2 ක් අවසාන වන විට හඳුන්කූරු පෙට්ටි 200 කට වඩා අලෙවිකරන බව පෙන්වන්න.

(04) i) $\frac{1}{7}+\frac{2}{7}$ සුළු කරන්න.

www.mathsland.org

ii) $\frac{3}{4}-\frac{1}{2}$ සුළු කරන්න.

iii) $\left(1\frac{1}{2}+\frac{2}{3}\right)$ න් $\frac{3}{13}$ හි අගය සොයන්න.

iv) 10 m ක් දිග රිබන් රෝලකින් $\frac{2}{3}m$ ක් දිග කැබලි කීයක් කැපිය හැකි ද?

(05) 9 ශ්‍රේණියේ සිසුන් පිරිසක් ලකුණු 50 ක් පිරිනමන ගණිතය ප්‍රශ්න පත්‍රයකට ලබාගත් ලකුණු පහත පරිදිවේ.

| වෘන්ත | පත්‍ර |
|---|---|
| 0 | 7 8 9 |
| 1 | 0 2 7 8 9 |
| 2 | 3 4 7 8 9 |

i) පන්තියේ සිසුන් ගණන කීයද?

ii) මාතය සොයන්න.


iii) මධ්‍යස්ථය සොයන්න.

iv) පරාසය සොයන්න.

v) මධ්‍යන්‍යය සොයන්න.

(06) රූප සටහන අනුව පිළිතුරු සපයන්න.

AB හා CD සරල රේඛා වේ. AC //BX වේ.




i) $x$ හි අගය සොයන්න.

ii) $y$ හි අගය සොයන්න.

iii) $(x + y)$ හි අගය කොපමණ ද?

iv) එනයින් $a$ හි අගය සොයන්න.

v) b හි අගය සොයන්න.


vi) b හා y අතර සම්බන්ධය කුමක් ද?

vii) ඒ අනුව AB හා CD සරල රේඛා ගැන කුමක් කිව හැකි ද?

www.mathsland.org

(07) රූප සටහනේ දක්වා ඇති බඳුනේ එක්තරා බීම වර්ගයක් පුරවා තිබේ.

අඳුරු කළ මුහුණතේ පරිමිතිය 40 cm කි.




i) අඳුරු කල මුහුණතේ පැත්තක දිග සොයන්න.

ii) අඳුරු කල මුහුණතේ වර්ගඵලය සොයන්න.

iii) මෙම බඳුනේ ධාරිතාව m$l$ වලින් සොයන්න.

iv) ඉහත බඳුනේ ඇති බීම, 80 m$l$ බැගින් කෝප්ප කීයකට දැමිය හැකි ද?

v) මෙම බඳුනේ බීම 600 m$l$ පවතින අවස්ථාවේ දී බීම මට්ටම පවතින උස සොයන්න.

